

ශ්‍රියාණි මද්දුමගේ




**සිරුරේ** ස්වභාවික පෙනුම වෙනස් කර ගැනීම සඳහා ශල්‍යකර්ම වල පිහිට පතන කාන්තාවෝ බොහෝ ය. දැනට දශක කිහිපයකට පෙර මෙවැනි ශල්‍ය කර්ම ධනවත් සහ ජනප්‍රිය පුද්ගලයනට පමණක් සීමා වුවද අද එය සාමාන්‍ය ජනතාව ආකර්ශණක කර ගැනීමට සමත් කර්මාන්ත.යක් බවට වර්ධනය ව ඇත. ඕස්ට්‍රේලියාවේ සාමාන්‍යයෙන් වසරකට මෙවැනි ශල්‍යකර්ම 50000 පමණද ශල්‍යාගාරයෙන් බැහැරව කෙරෙන රූපලාවන්‍ය ප්‍රතිකර්ම 250000 පමණද සිදුවන බව වාර්තා වෙයි.

### රූ සපුව වර්ධනය සඳහා සමාන්‍යයෙන් කෙරන ශෛල්‍යකර්ම කවරේ ද?

පියයුරු වල හැඩය සකස් කිරීම, නාසය මුහුණ හා තොල් වල හැඩය සකස් කිරීම, එල්ලා වැටෙන කම්මුල් නැවත සකස් කිරීම සහ උදරය හෝ කලවා වල මේදය ඉවත් කිරීම යනාදිය සඳහා ශල්‍යකර්ම භාවිතා කෙරෙන අතර සමේ පැහැය හෝ ස්වභාවය වෙනස් කිරීම, මුහුනේ රැළි වැටුණ ස්වභාවය ඉවත් කිරීම, පැල්ලම් ඉවත් කිරීම, නහර ඉවත් කිරීම සහ ලේසර් ප්‍රතිකර්ම මගින් කෙරෙන රෝම ඉවත් කිරීම යනාදිය ශල්‍ය කර්ම රහිතව රසායනික හෝ වෙනත් ක්‍රම භාවිතයෙන් සිදු කෙරෙයි.

### රූපලාවන්‍ය කටයුතු වර්තමානයේ මෙතරම් ප්‍රචලිත වීමට හේතු කවරේ ද?

වර්තමානයේ රූපලාවන්‍ය කටයුතු කෙරෙහි මෙතරම් දැඩි අවධානයක් යොම වීමට ප්‍රධාන හේතුව ව ඇත්තේ ඒවා විවිධ ප්‍රචාරක උපක්‍රම මගින් ජනතාව වෙත ඉදිරිපත් කිරීමයි. පුවත්පත් දැන්වීම් සහ රූපවාහිනී වෙළඳ දැන්වීම් මගින් ශල්‍යකර්මයට පෙර සහ පසුව සිරුරේ ස්වභාවය දැක්වෙන ඡායාරූප යොදාගෙන කරනු ලබන ප්‍රචාරක කටයුතු බොහෝ දෙනා ආකර්ෂණය කර ගැනීමට සමත්වී ඇත. තවද වර්තමානයේ මෙවැනි ශල්‍ය කර්ම හෝ ප්‍රතිකාර විධි සිදුකරන ස්ථාන බහුලව පවතින අතර ඒ සඳහා අය කෙරෙන මිල ගණන් බොහෝ දෙනෙකුට දැරිය හැකි මට්ටම් වල පැවතීමද කර්මාන්තයේ වර්ධනයට බලපෑ සාධකයන් ය. එහෙන්ම මෙම වෙළඳ ප්‍රචාරක කටයුතු මගින් ජනතාවට හඟවනු ලබන්නේ පුද්ගලයන්ගේ පෙනුමද සෞඛ්‍යය හා සමානවම වැදගත් තැනක් ගන්නා බවයි.

### වර්තමානයේ බොහෝ දෙනා තම රූ සපුව වර්ධනය කරගැනීමට උනන්දු වන්නේ ඇයි?

වර්තමාන සමාජයේ බොහෝ දෙනා මේ සඳහා යොමු වන්නේ එමගින් තම ආත්ම විශ්වාසය වර්ධනය කර ගැනීමටත් රැකියා අවස්තා හෝ රැකියාවේ උසස්වීම් ලබා ගැනීමටත් එය ඉවහල් වේ යයි පවතින විශ්වාසය හේතුවෙනි. තමන්ට ආකර්ශණීය රූපයක් පැවතීම තම දියුණුව උදා කර ගැනීමට මහෝපකාරී වේ යයි බොහෝ දෙනා සිතති. අද යම් අයෙකු සතුව පවත්නා කුසලතාවයන් පමණටම ඔහු හෝ ඇය සතු පෞරුෂයද රූප සොබාවද ඔහුගේ හෝ ඇයගේ ජීවිතයේ සාර්ථකත්වය සඳහා බලපාන හේතු කාරනා බවට පත්ව ඇත.

### වඩාත් බහුලව භාවිතා කෙරෙන රූපලාවන්‍ය උපක්‍රම මොනවාද ?

සම වයසට යාම වලක්වා ගැනීම සඳහාත් ලප කැලැල් ඉවත් කිරීම සඳහාත් කෙරෙන රූපලාවන්‍ය කටයුතු සඳහා බොහෝ දෙනා නැඹුරු වෙති. මේ සඳහා භාවිතා කෙරෙන වෙනත් ක්‍රම වලට වඩා ශල්‍යකකර්ම හෝ ප්‍රතිකාර විධි මතින් ඉක්මන් ප්‍රතිඵල ලැබීම ඊට හේතු විය හැකි ය.

එමෙන්ම කාන්තාවන් බොහෝ විට බර අඩු කැරගැනීමේ උපක්‍රමයක් ලෙසද ශල්‍යකර්ම වල පිහිට පතති. ආහාර පාලනය කිරීම හෝ ව්‍යායාම වල යෙදීම වැනි ක්‍රම වලට වඩා කෙටි කාලයක් තුළ පහසුවෙන් තම සිරුරේ තැන්පත්ව ඇති අනවශ්‍ය මේද ඉවත් කර ගැනීමට ශල්‍ය කර්ම යොදා ගත හැකි වීම ඊට හේතුවයි.

### රූපලාවන්‍ය ශල්‍යකර්ම ආශ්‍රිත ගැටළු මොනවාද?

රූ සපුව වර්ධනය කර ගැනීම සඳහා කෙරෙන ශල්‍ය කර්ම ඇඳුමක රැළි ඉවත් කිරීම තරම් සරළ හෝ පහසු දෙයක් නෙවේ. මෙවැනි ප්‍රතිකර්ම වල අතුරු ආබාධ බොහෝ ය. සාමාන්‍යයෙන් මෙවැනි කටයුතු සඳහා වෙළඳ ප්‍රචාර ලබාදීමේදී එහි අවදානම ගැන හෝ ඉන් ඇති විය හැකි අතුරු ආබාධ ගැන හෝ දැනුවත් කිරීමක් සිදු නොවේ. මෙැනි ස්ථාන වලින්

35 පිටට

